# බල්ලා, ගොනා හා තණකොළ

භාෂාව යන්න සංස්කෘතියෙහි ඉතා වැදගත් කොටසක් බව පැහැදිලි ය. ඇතැම් විට භාෂාව යනු සංස්කෘතියෙහි වැදගත් ම කොටස විය හැකි ය. භාෂාව චින්තනයට ද බලපෑම් කරයි. භාෂාව උපයෝගී කරගෙන යම් ප්‍රමාණයකට චින්තනය ද වෙනස් කළ හැකි ය. බුදුන් වහන්සේ ඒ කාර්යය කර ඇති ආකාරය හා වචනවලට වෙනත් තේරුම් දීමෙන් සමාජයේ වෙනසක් කර ඇති ආකාරය පැහැදිලි ය. (මින් අදහස් කරන්නේ බුදුන් වහන්සේගේ අරමුණ වුයේ ලෞකික විප්ලව කිරීම යැයි වරදවා නොවටහාගත යුතු බව නැවතත් අවධාරණය කළ යුත්තේ වෙනත් අරමුණු සහිත ව මේ ලිපිවලට වැරදි අර්ථකථන දීමට ඇතැමුන් පෙළඹෙන බැවිනි.) ආර්ය, බමුණු ආදී වචනවලට උන්වහන්සේ වෙනත් ම අර්ථකථන දුන්හ. යමකු බ්‍රාහ්මණයකු වන්නේ උපතින් නොවේයැයි උන්වහන්සේ දෙසූහ. ආර්යෂ්ටාංගික මාර්ගය ලෙස ඊනියා ආර්යයන් නොවන්නන්ට ද සසරින් එතරවීම සඳහා පිළිපැදිය හැකි මගක් උන්වහන්සේ සත්ත්වයනට කියා දුන්හ. බුදුසමය තුළ ආර්යයන් වහන්සේලා ඊනියා උසස් කුලවල අය වීම අනිවාර්ය හෝ ප්‍රමාණවත් හෝ නොවී ය.

භාෂාව සංස්කෘතියක ඉතා වැදගත් කොටසක් වුවත් භාෂාව යනු සමස්ත සංස්කෘතිය නොවේ. භාෂාවෙන් බාහිර වූ තවත් දෑ ද සංස්කෘතියට අයත් වෙයි. සංගීතය, චිත්‍රකලාව, නර්තනය ආදිය පමණක් නොව වෙනත් බොහෝ දෑ ද භාෂාවෙන් බාහිර ව පවතියි. පොදුවේ ගත්කල දැනුම නිර්මාණය මෙන් ම වෙනත් බුද්ධිමය කටයුතු ද භාෂාවෙන් ස්වායත්ත ව පවතියි. සංගීතය, චිත්‍රකලාව, නර්තනය, දැනුම නිර්මාණය ආදී කටයුතු යම් සංස්කෘතියක් තුළ සමස්තයක් ලෙස බැඳ තබන්නේ චින්තනය විසිනි. එනම් ඒ සියල්ල චින්තනය මත පදනම් වෙයි. එහෙත් මින් කියැවෙන්නේ සියල්ල චින්තනයට ඌනනය කළ හැකි බවක් නොවේ. සිංහල බෞද්ධයන්ගේ හා වෙනත් ආසියාතිකයන්ගේ චක්‍රීය චින්තනය තුළ ඌනිතවාදයට තැනක් නැත. බටහිර පශ්චාත්ව්‍යුහවාදීන් හා බටහිර පශ්චාත්නූතනවාදීන් මිනිසා භාෂා නිර්මිතයක් යැයි පවසන්නේ සංස්කෘතියට භාෂාවෙන් බාහිර දෑ ද අයත්වන බව නොසලකමින් හා ඌනිතවාදීන් වෙමිනි.

භාෂාවෙන් බාහිර ව කෙරෙන ඉතා වැදගත් කරුණක් ගැන අපි දැන් සාකච්ඡා කරමු. මෙහි දැක්වෙන ඇතැම් කරුණු මහාචාර්ය රිචඩ් නිස්බට් මහතා විසින් රචිත “ද ජෙයාග්‍රෆි ඔෆ් තෝට්” යන කෘතියෙහි සඳහන් වෙයි. අප මෙහි දී සැලකෙන්නේ වර්ගීකරණයයි. වර්ගීකරණය යන්න කෙරෙන්නේ භාෂාව යොදා ගනිමිනි. දී ඇති භාණ්ඩ කිහිපයක් වර්ගවලට බෙදන්න යනුවෙන් කියන්නේ වචනවලිනි. එහෙත් මිනිසුන් භාණ්ඩ වර්ගීකරණය කරන්නේ භාෂාව යොදාගනිමින් නොවේ. වර්ගීකරණය යන්න බටහිර විද්‍යාවේ දී මෙන් ම වෙනත් විද්‍යාවන්හි දී ද වැදගත් වෙයි. එහෙත් ඒ ඒ විද්‍යාවන් වර්ගීකරණය යනුවෙන් හැඳිනගන්නේ එකම ආකාරයකට කරන්නක් නොවේ. මේ පිළිබඳ කෙටි විස්තරයක් ආයුර්වේදය සම්බන්ධයෙන් කලකට පෙර අප ලියූ ලිපිවල සඳහන් වෙයි.

අපි උදාහරණයක් ලෙස බල්ලා, ගොනා, හා තණකොළ මිටිය යන වස්තු ගනිමු. මේ වස්තු තුනෙන් එක් කාණ්ඩයකට අයත් වස්තු දෙක නම් කරන්න යැයි ඔබෙන් ඉල්ලා සිටියහොත් ඔබ තෝරා ගන්නේ කිනම් වස්තු දෙක ද? මෙවැනි ප්‍රශ්න පස්වැනි වසරේ ශිෂ්‍යත්ව පරීක්ෂයෙහි දී මෙන් ම උසස් පෙළ පොදු සාමාන්‍ය පරීක්ෂණ ප්‍රශ්න පත්‍රයෙහි ද ඇසිය හැකි ය. එබැවින් එවැනි ප්‍රශ්න ගැන ඔබට යම් අවබෝධයක් ඇති බවට සැකයක් නැත. මේ ප්‍රශ්නයට සිසුන් දෙන පිළිතුරු දෙකක් වෙයි. එක් පිළිතුරකට අනුව බල්ලා හා ගොනා එකම කාණ්ඩයකට අයත්වන අතර අනෙක් පිළිතුරට අනුව එක් කාණ්ඩයකට අයත්වන්නේ ගොනා හා තණකොළ මිටිය ය. මේ පිළිතුරු දෙකෙන් නිවැරදි වන්නේ කුමක් ද යන්න තීරණය වන්නේ ඒ ඒ සංස්කෘතිය විසින් වස්තු වර්ග කෙරෙන්නේ කෙසේද යන්න මත ය.

බල්ලා හා ගොනා එකම ගොඩකට, එනම් එක් කාණ්ඩයකට අයත්වන්නේ යැයි තීරණය කෙරෙන්නේ ඉංගිරිසියෙන් ටැක්සොනොමි නමින් හැඳින්වෙන වර්ගීකරණය අනුව ය. මේ වර්ගීකරණයෙහි දී එක් කාණ්ඩයකට අයත්වන වස්තු එකම නමකින්, එනම් එකම නාම පදයකින් හැඳින්විය හැකි ය. බල්ලා හා ගොනා සිව්පාවුන් ලෙස හෝ ක්ෂීරපායින් ලෙස හෝ සැලකිය හැකි ය. එහි දී සැලකෙන්නේ ඒ ඒ වස්තුවෙහි ඇති ගුණ වෙයි. බල්ලන්ට කකුල් හතරක් වේ. කුඩා වසු පැටවු කිරි බී වැඩෙති. ඒ ඒ ගුණ වෙන වෙන ම ගත්කල ද ඒ ඒ වස්තුවලට අයත්වෙයි. මෙහි දී ඒ ඒ වස්තු වෙන

© Prof. Nalin De Silva

වෙන ම ගැනීම ප්‍රධාන කරුණ වෙයි. එසේ වෙන වෙන ම ගත්කල ඒ ඒ සතුන්ට ඇති ගුණ, පොදුවේ ද ඒ සතුන්ට අයත් වෙයි. වසු පැටවුන් මෙන් ම බලු පැටවු ද කිරි බී වැඩෙති. බල්ලන්ට මෙන් ම ගොනුන්ට ද කකුල් හතරක් වෙයි.

අනෙක් අතට ගොනා හා තණකොළ මිටිය එක් කාණ්ඩයකට අයත් ලෙස වර්ග කෙරෙන්නේ ඒ ඒ වස්තු වෙන වෙන ම ගෙන ඒවාහි ගුණ සලකමින් හා පසුව පොදු ගුණයක් මත පිහිටමින් නොවේ. ගොනුන්ට හා තණකොළ මිටිවලට පොදු වූ ගුණයක් නැත. එක ම පොදු ගුණය සමහරවිට ඒවා වස්තු වීම පමණක් විය හැකි ය. එහෙත් එය වර්ගීකරණයක් සඳහා සුදුසු පොදු ගුණයක් නොවන්නේ ගෙවල්, තාරකා ආදී සියල්ල ද වස්තු බැවින් විශ්වයෙහි පවත්නා සියල්ල එක් කාණ්ඩයකට දැමිය හැකි බැවිනි. අපට අවශ්‍ය වන්නේ සියල්ල එක් කාණ්ඩයකට දැමීමට නොව, කිහිපයක් පමණක් එක් කාණ්ඩයකට අයත් ලෙස හඳුනාගැනීමට ය. ගොනා හා තණකොළ මිටිය එක් කාණ්ඩයකට අයත් ලෙස සැලකෙන්නේ ඒ වස්තු වෙන වෙන ම ගෙන ඒවාහි ගුණ සැලකීමෙන් නොව, ඒ වස්තු අතර ඇති අන්තර්සම්බන්ධයක් සැලකීමෙනි. ගොන්නු තණකොළ ආහාරයට ගනිති. ඒ අරුතින් ගොනුන් හා තණකොළ අතර යම් සම්බන්ධයක් ඇති වෙයි. මේ සම්බන්ධය මත පදනම් වී අපි ගොනා හා තණකොළ මිටිය එකම කාණ්ඩයකට අයත් යැයි සලකමු. එසේ එක් කාණ්ඩයකට අයත් යැයි සැලකුව ද ගොනුන්ට හා තණකොළවලට කිව හැකි සිවුපාවුන්, ක්ෂීරපායින් ආදී වශයෙන් වූ එක නමක් නැත.

සමස්තයක් ලෙස ගත්කල බටහිරයෝ වස්තු වෙන වෙන ම ගෙන ඒවාහි පොදු ගුණ මත පදනම් වී ටැක්සොනොමි යනුවෙන් හැඳින්වෙන වර්ගීකරණයෙහි යෙදෙති. චීන ජපන් වැනි නැගෙනහිර ආසියාතිකයෝ සමස්තයක් ලෙස ඒ ඒ වස්තු අතර ඇති සම්බන්ධය මත පදනම් වී ඒ ඒ වස්තු වර්ගීකරණය කරති. එහි දී වස්තු වෙනත් වස්තු සමග සම්බන්ධවන්නේ කිනම් සන්දර්භයක් (කොන්ටෙක්ස්ට්) තුළ ද යන්න සැලකිල්ලට ගැනෙයි. සිංහලයන් ද අද කෙසේ වෙතත් එදා වර්ගීකරණය කෙළේ වස්තු අතර ඇති සම්බන්ධකම් හා වෙනත් සම්බන්ධකම් මෙන් ම සන්දර්භය ද පදනම් කරගෙන ය.

බටහිර නොවන බොහෝ දැනුම්වල සන්දර්භය අතිශයින් ම වැදගත් වෙයි. එවැනි දැනුම්වල වස්තු හඳුනාගැනෙන්නේ ද සන්දර්භයක් තුළ ය. බටහිරයෝ සන්දර්භය අමතක කර වස්තුව අනෙක් වස්තුවලින් වෙන්කර හඳුනාගනිති. මේ වෙන්කිරීමට ඉංගිරිසියෙන් ඩිකොන්ටෙක්ස්චුවලයිසේෂන් යැයි කියනු ලැබේ. එයට සිංහලෙන් විසන්දර්භීකරණය යැයි කිව හැකි ය. විසන්දර්භීකරණයෙහි ඇත්තේ වියුක්තබවකි. විසන්දර්භීකරණයෙහි වස්තු වෙන ම ගන්නවා පමණක් නොවේ. එහි දී වාක්‍යයෙහි සන්දර්භයෙන් තොර ව වචනයකට අර්ථ නිරූපණයක් ද කෙරෙයි. ඉංගිරිසියෙහි අ ඩෝග්, ද ඩෝග්, ද ඩෝග්ස් හා ඩෝග්ස් යනුවෙන් යෙදුම් වෙයි. සිංහලෙන් අපට ඇත්තේ බල්ලෙක්, බල්ලා හා බල්ලෝ යන යෙදුම් ය. ඉංගිරිසියෙහි මාර්තෘකාවට අදාළ බල්ලකු හෝ බල්ලන් ගැන සඳහන් කිරීමේ දී සෑමවිට ම එක්කෝ අ නැත්නම් ද යන්න මුලින් සඳහන් විය යුතු ය. ඩෝග් බාර්ක්ඩ් යන්න ඉංගිරිසියෙහි වැරදි ව්‍යවහාරයකි. එය එක්කෝ අ ඩෝග් බාර්ක්ඩ් විය යුතු ය; නැත්නම් ද ඩෝග් බාර්ක්ඩ් විය යුතු ය. අ ඩෝග් යනු අප නොදන්නා බල්ලෙකි. ද ඩෝග් යනු අප දන්නා කලින් හැඳිනගෙන ඇති බල්ලෙකි. මෙයට අමතර ව ඩෝග්ස් වෙති. මෙහි ද ඩෝග්ස් යනුවෙන් නොයෙදෙන්නේ නම් ඉන් කියැවෙන්නේ බලු වර්ගය ගැන ය. ඩෝග්ස් බාර්ක් යනුවෙන් කිවහොත් ඉන් කියැවෙන්නේ බල්ලන් නමැති වර්ගයේ ගුණයකි. බල්ලන් නමැති වර්ගය බුරන බව ඉන් කියැවෙයි. එහි දී බල්ලන් නමැති වර්ගය වෙන ම ගෙන ඇත.

සිංහලෙන් බල්ලෝ බුරති යනුවෙන් කී කල, ඉන් කියැවෙන්නේ කුමක් ද? ඉන් කියැවෙන්නේ අප දන්නා බලු රංචුවක් බුරන බව ද, එසේත් නැත්නම් බල්ලන් යන සත්ත්ව කොටස බිරීම යන ගුණය උරුම කරගෙන ඇති බව ද? එනම් බල්ලන් සත්ත්ව වර්ගයක් ලෙස ගත්කල බුරන බව ද? අපට එය දැනගත හැක්කේ වාක්‍යයෙහි සන්දර්භයෙන් පමණකි. සන්දර්භයෙන් තොරව වස්තු ගැන කතා කිරීම සඳහා ඉංගිරිසි බසෙහි අ හා ද යන පද නිපදවා ගෙන ඇත. බොහෝ බටහිර භාෂාවල හා අරාබි භාෂාවෙහි ද එවැනි ප්‍රයෝග ඇතැයි කියැවෙයි. එහෙත් සිංහලයෙහි අපට එවැනි යෙදුම් නැත. අප ඉංගිරිසි ඉගෙන ගැනීමට ගිය විට අ හා ද පද යෙදෙන්නේ කෙසේ ද යන්න ගැටළුවක් වන්නේ අපට විසන්දර්භීකරණයක් නැති බැවින් ය. බටහිර ඊනියා පශ්චාත්නූතනවාදීන් කතාකරන විසංයෝජනය (ඩිකන්ස්ට්‍රක්ෂන්) යන්න එක් අතකින් ගත්කල විසන්දර්භීකරණය තව දුරටත් වර්ධනය කිරීමක් ලෙස ද සැලකිය හැකි ය. මෙරට

© Prof. Nalin De Silva

අනුකාරකයන් විසංයෝජන ආදිය ගැන කතාකරන්නේ මෙලෝ හසරක් නොදැන ය. ඔවුන්ට විසංයෝජනයෙහි ඇති සන්දර්භයවත් නොතේරෙයි. අනුකරණය ආත්ම කරගත් ඔවුන් දන්නේ විසන්දර්භීය ව අනුකරණය කිරීම පමණකි.

අද බටහිර උද්භිද විද්‍යාවෙහි ඇත්තේ ටැක්සොනොමි නම් වර්ගීකරණයයි. මේ වර්ගීකරණය උද්භිද විද්‍යාවෙහි දී ලොවට හඳුන්වා දී ඇත්තේ ලිනෙයාස් නම් විද්‍යාඥයෙකි. ඔහුට ඒ වර්ගීකරණය සඳහා අවශ්‍ය පැල හා දැනුම ලබා දීමට සිංහලයන් ද මුල් වී ඇත. අප රට මුහුදුකරය පෘතුගීසීන්ට යටත්ව සිටි සමයෙහි ගෝවේ සිටි ගාර්ෂියා ඩ වොර්ටා නම් පුද්ගලයකු ලංකාවෙන් ද ලබාගත් දැනුම මත පිහිටා ලියන ලද දෑ වත්මන් බටහිර උද්භිද විද්‍යාවේ උපතට මුල් වී ඇත. අද මෙන් ම එදා ද අපේ ශාබ හා වෙනත් සම්පත් ද ඒ ආශ්‍රිත දැනුම ද බටහිරයෝ කිසිදු ගෙවීමක් නොකර අපේ රටවලින් ඔවුන්ගේ රටවලට ගෙන ගියහ. අද එදාට ද වඩා සියුම් ව හා ඊනියා ජාත්‍යන්තර, එනම් බටහිරයන්ගේ නීතියට එකඟ ව මේ සම්පත් හා දැනුම් මංකොල්ලය සිදුවෙයි. එහි ප්‍රතිඵලයක් ලෙස අපට අද අපේ බොහෝ සම්පත්වලට හා දැනුම්වලට ඇති අයිතිය පවා නැති වී ගොස් ය.

බටහිර විද්‍යාඥයන්ට පිහිට වූයේ අපෙන් ගෙන ගිය පැලවර්ග හා ඒ ආශ්‍රිත අපේ වර්ගීකරණයයි. ඒ වර්ගීකරණය ටැක්සොනොමි වර්ගීකරණයක් නොවී ය. අපේ එකල තිබූ වර්ගීකරණය පදනම් වී ඇත්තේ ශාබ වෙන ම ගෙන ඒවාහි ගුණ ගැන කරන ලද අධ්‍යයනයක් මත නොව ශාබ බෙහෙත් ලෙස අපට වැදගත්වන්නේ කෙසේ ද යන්න මත ය. අපේ වර්ගීකරණය ශාබ හා මිනිසා අතර තිබූ සම්බන්ධය මත පදනම් වූවකි. අපේ සංස්කෘතිය තුළ සියළු ශාබ බෙහෙත් විය. අපට වල්පැල යනුවෙන් පැල නොවී ය. ඕනෑම පැලයක් අපට, එනම් සිංහලයන්ට යම් ආකාරයකින් ප්‍රයෝජනවත් විය. පැලයක් වල්පැලයක් බවට පත්වන්නේ යම් සංස්කෘතියක් තුළ ය. සංස්කෘතියෙන් වෙන්කරගත් විසන්දර්භීකරණය වූ වල්පැල ලෝකයේ ඇති බව අපට කියා දෙන්නේ ඊනියා වල්පැල නාශක රසායනික ද්‍රව්‍ය විකුණන බටහිර අධිපතිවාදී වෙළෙඳුන් බව අමතක නොකළ යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva